මහජන බැංකුව | மக்கள் வங்கி

PEOPLE'S BANK

# ටෙන්ඩර් දැන්වීමයි.

ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය (CSR Project) වෙනුවෙන් පහත සඳහන් අයිතම සැපයීම, නඩත්තු හා සේවා කිරීම පිළිබඳව පිළිගත් දේශීය සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | අයිතම පිළිබඳ විස්තර | ලංසු ඇපකරයේ වටිනාකම | අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය | ටෙන්ඩරයන් විවෘත කරනු ලබන දිනය |
|---|---|---|---|---|
| P-091/2025 | වන අලි දුම්රිය ගැටීම් වැලැක්වීමේ පද්ධති 39 ක් මිලදී ගැනීම. | මුළු ඇස්තමේන්තු ගත වටිනාකමින් 3% ක් (රු.මි 5.0 ඉක්මවන්නේ නම්) | 2025.11.19 දින ප.ව 2.00 | 2025.11.20 දින ප.ව 2.00 |

1. ටෙන්ඩර් අයදුම්පත් 2025.10.31 දින සිට 2025.11.19 දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා අංක:30/101, කිව්පාර, කොළඹ 02 පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, එක් ටෙන්ඩරයක් වෙනුවෙන් රු. 5,000/- ක ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවිය යුතුය. අයදුම්පත් ලබාගැනීම සඳහා තම ආයතනයේ ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කල යුතුය.

2. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර් පත සමග ටෙන්ඩරයේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මි 5.00 ඉක්මවන්නේ නම්, ඇස්තමේන්තුගත වටිනාකමින් 3% ක වටිනාකමකින් යුත් ලංසු ඇපකරයක් පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගෙන ඉදිරිපත් කළයුතු අතර, එය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. මේ සඳහා දින 180 කට වලංගු බැංකු ගෙවීම් ඇණවුම් හෝ අණකර ඉදිරිපත් කළහැකි අතර , පුද්ගලික චෙක්පත් බාරගනු නොලැබේ. මහජන බැංකුවේ ඕනෑම ආකාරයක ගිණුමක මුදල් ස්වරූපයෙන් ඇති තැන්පතුවක් හා ඊට අදාල හිලව් ලිපියක් වුවද ලංසු බැදුම්කරයක් ලෙස පිළිගත හැක.

3. මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් මහජන බැංකුව , සැපයීම් දෙපාර්තමේන්තුව,30/101, කිව් පාර, කොළඹ 02 ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙම ටෙන්ඩරයන් ඉහත සඳහන් දින ප.ව.2.00 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩරය විවෘත කරන දින ප.ව.2.00 න් පසුව ලැබෙන ටෙන්ඩර්පත් විවෘත නොකරම ආපසු බාරදෙනු ලැබේ.

4. සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරය අවලංගු කිරීම හෝ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය මහජන බැංකුව සතුය. අවම මිල පිළිගැනීමට බැංකුව බැඳී නොමැත.

5. මේ පිළිබඳ වැඩි විස්තර පහත දුරකථන අංක මගින් ප්‍රධාන කළමනාකාර (සැපයීම්) වෙතින් ලබා ගත හැකිය.

ප්‍රධාන කළමනාකාර (සැපයීම්)
මහජන බැංකුව,
සැපයීම් දෙපාර්තමේන්තුව,
අංක. 30/101,කිව් පාර,කොළඹ 02.

දුරකථන අංක : 2439577 - 8
ෆැක්ස් : 2439576
වෙබ් අඩවිය : www.peoplesbank.lk
ඊමේල් : supplies@peoplesbank.lk